# පරිසරය

## 4 ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education





# 12.මිනිස් හැසිරීම

වඩාත් හොඳ සමාජයක් ඇති කිරීම සඳහා එකිනෙකාට ගෞරවයෙන් සලකන අන් අයට සවන් දෙන පුද්ගලයන් සිටීම වැදගත් වේ.ඒ අනුව අප ද අන් අය පිළිබඳව සංවේදීව කටයුතු කිරීමට පුරුදු වීම තුළින් යහපත් සමාජයක් ඇති කිරීමට දායක විය හැකිය.

අපි  එකිනෙකාට ඇති හැකියාවන් හා දක්ෂතාවන් විවිධ වේ.  එබැවින් තමා තුළ ඇති අන් අය තුළ නොමැති දක්ෂතාවන්ට උසුලු විසුලු නො කළ යුතුය. සෑම දෙනාට ම විවිධ වූ හැකියාවන් ඇත.  අන් අය ගේ හැකියා අගය කිරිමෙන් ඔවුන් සතුටු වේ. තමා ගේ සිතට ද සතුටක් ඇති වේ

## ක්‍රියාකාරකම 1

- තමාට තනිව කළ හැකි දේ ලියන්න.

  ......................................................................................................................................
  ......................................................................................................................................
  ......................................................................................................................................
  ......................................................................................................................................
  ......................................................................................................................................

- තමාට තනිව කළ නොහැකි අන් අයගේ සහය ඇතිව කරන දේ ලියන්න

  ......................................................................................................................
  ......................................................................................................................
  ......................................................................................................................
  ......................................................................................................................
  ......................................................................................................................



Copyright© www.e-thaksalawa.moe.gov.lk





**ක්‍රියාකාරකම 2**

- පහත ගුණාංග ඔබ සතුවේ නම් (√) ලකුණ ද ඔබ සතු නොවේ නම් (X) ලකුණ ද වරහන තුළ දක්වන්න.

1. දෙමාපියන් කියන දේ අහනවා. ( )
2. උදෑසනම අවදි වෙනවා . ( )
3. ගුරුවරුන්ට ගරු කරනවා. ( )
4. මිතුරන් සමඟ සමගියෙන් සිටිනවා. ( )
5. වෙලාවට කෑම කනවා. ( )
6. තමා ගේ වැඩ තමා ම කර ගන්නවා. ( )
7. නිවසේ කටයුතුවලට උදවු කරනවා. ( )
8. අන් අය ගේ සිත් රිදවන්නේ නෑ. ( )
9. වරදක් වූ විට සමාවෙන්න කියනවා. ( )
10. උදවුවක් ලැබුණ විට ස්තූතියි කියනවා. ( )

- ඔබගේ හෝ අන් අයගේ හැකියා අගය කිරීමේ වැදගත්කම ගැන වගන්ති පහක් ලියන්න.

..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................


Copyright© www.e-thaksalawa.moe.gov.lk



## ක්‍රියාකාරකම 3

- මිනිසුන් තුළ ඇති මනුස්සකම් , ගුණදම්, දස්කම්,විශිෂ්ට හැකියාවන් අගය කිරීමත්, ශරීරය වෙහෙසා වැඩ කිරීමෙන් ලැබෙන සතුටත්, සිත් තුළ ඇතිවන ආකාරයේ පහත සඳහන් ගීතය දරුවාට ඇසීමට සලස්වන්න. අර්ථය පැහැදිලි කර දීමට වැඩිහිටි සහාය ලබා දෙන්න.



වෙර වීරිය ඇතත් සිතේ
පියකරු බව ඇතත් වතේ
දහඩිය නොම හැලෙන ගතේ
ඔබ පොළොවට බරකි පුතේ

නරවිරුවන් අපගෙ පුතේ
ඉදිකළ වැව් බලන් පුතේ
දෑතේ සවියෙනුයි පුතේ
ඒ මහ වැව් බැඳුණෙ පුතේ

එවන් ලෙයින් උපන් පුතේ
සුරුවිරුකම් ඔබට ඇතේ
දෑ උරුමය ඇතිව සිතේ
මව්බිම දෙස බලන් පුතේ

ගායනය- එඩ්වඩ් ජයකොඩි මහතා
චරිතා ප්‍රියදර්ශනි මහත්මිය

අන්තර්ගතය: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සැකසුම: ජී.කේ් සත්‍ය ධනංජය ජයරත්න—හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය—වීරකැටිය
Copyright© www.e-thaksalawa.moe.gov.lk



හැකිනම් පහත සඳහන් ගීතද ඇසීමට සලස්වන්න.



- මිනිසා සුවඳයි මලසේ-නුවණින් එළියයි හිරු සේ
  ගායනය: සුනිල් එදිරිසිංහ මහතා
- ❖ පුංචි සිතේ පුංචි සිනා වෙල් ඉපනැල්ලේ
  ගායනය: නීලා වික්‍රමසිංහ මහත්මිය

ඔබ අනාගතයේදී රටට වැඩදායී පුද්ගලයෙකු ලෙස කටයුතු කරන ආකාරය පිළිබඳව ඔබේ අදහස් ලියන්න.

.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

අපේ රටේ නිදහස් අධ්‍යාපනයක් ලැබීමට සෑම දරුවෙකුටම අවස්ථාව ලැබී ඇත. ඒ සඳහා පොත් පත්, ඇඳුම් පැළඳුම් , ආහාර පාන , රක්ෂණාවරණ ආදී විවිධ දේ ලබා දීමට රජය කටයුතු කර ඇත. නිදහස් අධ්‍යාපනයෙන් අපි උපරිම පල නෙළා ගත යුතුය. ඒ අනුව සෑම අවස්ථාවකදීම උපරිම කැපවීමෙන් ක්‍රියා කොට දෙමාපියන් හා රජය නොමිලේ දෙන සම්පත් උපරිමයෙන් පරිහරණය කිරීමෙන් රටට වැඩදායී නැණ නුවණ සපිරි ආදර්ශමත් පුරවැසියෙකු ලෙස අවංකව රටට සේවය කිරීමට අපි අදිටන් කර ගනිමු.


Copyright© www.e-thaksalawa.moe.gov.lk



## ක්‍රියාකාරකම 4

- ඔබ අසරණ අයෙකුට උදව් කළ අවස්ථාවක් අඳින්න.


අන්තර්ගතය: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම: ජී.කේ් සත්‍ය ධනංජය ජයරත්න—හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය—වීරකැටිය



Copyright© www.e-thaksalawa.moe.gov.lk



- පහත වගන්ති කියවා (√ ) හෝ (X) ලකුණ වරහන තුළ යොදන්න.

හොඳ ඇඳුම් ආහාර වගේම පාසල් යාමට පොත්පත් මේ සියල්ලම අඩුවක් නැතිව ඔබට ලැබිලා ඇති. එහෙත් ,

1. කෑමට ආහාරයක් නැති දරුවන් ඔබ දැක තිබේද? (  )
2. අඳින්න ඇඳුම් නැති දරුවන් ඔබ දැක තිබේද? (  )
3. පාසල් නොයන දරුවන් ඔබ දැක තිබේද? (  )
4. සිඟමන් යදින දරුවන් ඔබ දැක තිබේද? (  )
5. දෙමාපියන් නැති දරුවන් ඔබ දැක තිබේද? (  )
6. ළමා මෙහෙකාර සේවයේ යෙදෙන දරුවන් ඔබ දැක තිබේද? (  )

සෑම දරුවෙකුම පාසල් අධ්‍යාපනය ලැබිය යුතුය. ආදරය, කරුණාව නිසි පරිදි ලැබිය යුතුය. ආහාර පාන, ඇඳුම් පැළඳුම් ලැබිය යුතුය. ආරක්ෂාව , රැකවරණයද ලැබිය යුතුය.

## ක්‍රියාකාරකම 5

- අප ජීවිතයේ සුබ පැතීම් සිදු කරන අවස්ථා මොනවාද?

  ..........................................................................

  ..........................................................................

  ..........................................................................

- එවැනි අවස්ථාවක අපට කළ හැකි දේ මොනවාද?

  ..........................................................................

  ..........................................................................

- සුබ පැතුම් පතක් නිර්මාණය කිරීමට ගත හැකි ද්‍රව්‍ය මොනවාද?

  ..........................................................................

  ..........................................................................

  ..........................................................................



Copyright© www.e-thaksalawa.moe.gov.lk



### ක්‍රියාකාරකම 6

- ඔබේ මිතුරාගේ උපන් දිනයට ගැලපෙන සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

කෙනෙකුට සුබ පැතීමෙන් සිදුවන යහපත් දේ,



- ➢ මිත්‍ර සබඳතා අලුත් වීම
- ➢ නෑදෑ හිතවත් සබඳතා අලුත් වීම
- ➢ විශ්වාසයක් ගොඩ නැගීම
- ➢ මානසික සුවයක් ලැබීම
- ➢ අන් අය ගේ ගෞරවයට පාත්‍ර වීම
- ➢ සුහදතා වර්ධනය වීම
- ➢ වගකීම් ඉටු කිරීමට හැකි වීම
- ➢ අවම වියදමකින් ලොකු සතුටක් අත්වීම
- ➢ අලුත් යමක් නිර්මාණය කිරීමෙන් සතුටක් ලැබීම

- පහත කවිය දරුවාට කියා දෙන්න. කවියේ අදහස කියා දෙන්න

බඩගිනි වෙලා මා ගිය කල පුතුගේ ගෙට
මැනලා වී ටිකක් දුන්නයි මල්ල කට
ගන්දෝ නොගන්දෝ කියලා සිතුණි මට
මැනලද පුතේ කිරි දුන්නේ මා නුඹට


Copyright© www.e-thaksalawa.moe.gov.lk



- දෙමාපියන්ට නොසලකන දරුවන් සිටින අද සමාජය තුළ දෙමාපියන් පිළිබඳව සංවේදී විය යුතු බව කියා දෙන්න.

  උදා :- වැඩිහිටි නිවාසවලට දෙමාපියන් බාර දීම.
  මංමාවත්වල අසරණ කර දමා යාම.
  කෑම බීම නොදී රඳවා සිටීම

- මෙවැනි දෑ නොකළ යුතු බව කියා දෙන්න.

කිසියම් අවස්ථාවකදී, අන් මත වලදී හා හැසිරීම් වලදී ගැටලු ඇති නොවන පරිදි ප්‍රතිචාර දැක්වීම ඉතා වැදගත්ය. ඒ නිසා සහනශීලීව අදහස් ප්‍රකාශ කළ යුතුය. වර්තමාන සමාජය තුළ දරුණු අපරාධ මිනීමැරුම් කෝලාහල ඇති වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙම අන් මතවලට හා හැසිරීම්වලට දක්වන ප්‍රතිචාර සහනශීලි නොවීමයි. සෑම විටදී ම අන් අය ගේ මතවලට ඇහුම් කන් දෙන්න. අන් අය ගේ අදහස් වලට අවස්ථාව ලබා දෙන්න.

එවිට ,

- ගැටුම් වලක්වා ගැනීමට හැකිය.
- හොඳ හිත දිගටම පවත්වාගෙන යා හැකිය.
- කාරුණික වීමට හැකිය.
- වගකීම් දැරීමට හැකිවේ.
- අන් අය ගේ ගරුත්වය ආරක්ෂා කිරීමට හැකිය.
- සමාජය තුළ යහපත් පුද්ගලයෙකු ලෙස හැසිරීමට හැකිය.

- **විශේෂ අවස්ථාවලදී කෙනෙකුට සුබ පැතුම් පත් එවීමෙන් සිදුවන යහපත් දේවල් මොනවාද ?**

  ..........................................................................................

  ..........................................................................................

  ..........................................................................................

  ..........................................................................................

  ..........................................................................................

අන්තර්ගතය: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සැකසුම: ජී.කේ සත්‍ය ධනංජය ජයරත්න—හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය—වීරකැටිය
Copyright© www.e-thaksalawa.moe.gov.lk